**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව - 2017**

**----------------------------------------------------**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 ජූලි 17 දින නිකුත් කර ඇත.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිතියෙන් අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

---

සංස්ථාව විසින් 1981 වර්ෂයේදී ලංකා සිමෙන්ති සමාගමේ රු.10 යේ කොටස් 108,361,891 ක රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබූ අතර, මෙම කොටස්වල වර්තමාන වෙළඳපොල වටිනාකම රු.617,662,779 ක් විය. ඒ අනුව සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ කොටස් හිමිකමෙන් සියයට 62.45 ක් සංස්ථාව සතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1964 අප්‍රේල් 17 දිනැති අංක 14012 දරන ගැසට් නිවේදනය මඟින් කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්තශාලාව සහ ඉඩම සංස්ථාව වෙත නීත්‍යානුකූලව පවරා තිබුණද, එම වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ පාලවි හි පිහිටි අට්ටවිල්ලු නැමති සංස්ථාව සතු අක්කර 221 ක් වූ ඉඩමෙන් අක්කර 69 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි සංස්ථාව සතු අක්කර 5352 ක් වූ අරුවක්කාලු හුණුගල් නිධිය වසර 50 ක කාලයකට හොල්සිම් ලංකා සමාගම වෙත (වර්තමානයේ සියැම් සිටි සමාගම) බදු දී තිබුණි. සමාලෝචිත වර්ෂය වන විටත් සංස්ථාවේ ප්‍රධාන ආදායම වූ මෙම වත්කම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2013 වර්ෂයට අදාළ ගෙවිය යුතු එකතුව රු.255,967 ක ආර්ථික සේවා ගාස්තු බදු මුදල හා 2016 වර්ෂයේ දෝෂ සහිත ගණනය කිරීම් හේතුවෙන් වැඩිපුර ගෙවා තිබූ රු.129,211 ක ආර්ථික සේවා ගාස්තු ගෙවීම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දැනුම්දීමකින් තොරව ලෙජර් ගිණුම් වලින් එකිනෙකට හිලවු කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු බදු ගිණුමේ ශේෂය රු.129,211 කින් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ඉ) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් 1990 ගිණුම් වර්ෂයට අදාළව නිකුත් කරන ලද රු.335,249 ක විගණන ගාස්තු ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර ගෙවීමට කටයුතු කර නොතිබුණි. එසේම 2016 සහ 2017 වර්ෂ සඳහා විගණන ගාස්තු වෙන් කිරීම 2015 වර්ෂය පදනම් කරගෙන සිදු කිරීම නිසා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා එකතුව රු.571,875 ක් අඩුවෙන් වෙන් කිරීම් කර තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුම් විෂයය | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|
| (අ) 2008 වර්ෂයේ සිමෙන්ති මෙට්‍රික් ටොන් 8600 ක් ආනයනය කිරීම. | මුළු සිමෙන්ති ආනයනයට අදාළ ගෙවීම් වවුචර්, ක්‍රමවත්ව නඩත්තු කළ ලිපිගොණු සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ. |
| (ආ) පරිගණක හා කාර්යාල උපකරණ | සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව තොග ඌනතා භාණ්ඩ 32 ක පිරිවැය වටිනාකම. |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.74,469,339 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය තුළ වසර 1 ත් වසර 3 ත් අතර එකතුව රු.11,510,027 ක්ද, වසර 03 ට වැඩි ණය ශේෂවල එකතුව රු.58,179,621 ක්ද වූ අතර මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.42,317,003 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය තුළ වසර 1 ත් වසර 3 ත් අතර ණය ශේෂවල එකතුව රු.2,851,642 ක්ද වසර 3 ට වැඩි ණය ශේෂවල එකතුව රු. 35,896,742 ක්ද වූ අතර, මෙම හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට පියවරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.12,854,883 ක් වූ පූර්ව වර්ෂ වලට අදාළ එකතු කළ අගය මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු එකතුව රු.8,410,618 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් මෙම වාර්තාවේ දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 751 | රෙගුලාසිය ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (I) 05 (1)(අ) වගන්තිය | අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාරය තුළ ඇති ශක්තීන් හා දුර්වලතා ඇගයීමට ලක් කරමින් සැලසුම් යාවත්කාලීන කළ යුතු වුවත්, සපුරාගත නොහැකි වූ අරමුණු සහ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අරමුණු පිළිබඳ විධිමත් ඇගයීමක් සිදුකර සංස්ථාවේ සැලසුම් යාවත්කාලීන කර නොතිබුණි. |
| (II) 05 (1)(ඇ) වගන්තිය | කාලීනව ලඟා කරගත යුතු ඉලක්ක ස්ථාපිත කිරීම හා ඒවා සපුරා ගැනීමේ වගකීම මෙහෙයුම් මට්ටම දක්වා බෙදාහැරිය යුතු වුවත්, වාර්ෂිකව ලඟා කරගත යුතු ඉලක්ක සහ එම අරමුණු සඳහා වගකීම බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 9.4 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව සේවකයින් දෙදෙනෙකු 2017 අගෝස්තු 01 දින සිට සිමෙන්ති සමාගම වෙත මුදා හැර තිබුණි. |
| (ඉ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | අත්තිකාරම් පියවීම නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත්, 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අවස්ථා 13 කදී ලබා දුන් එකතුව රු.240,946 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන දිනටද පියවීම් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.15,298,106 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.31,700,843 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,402,737 ක අඩුවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ විකුණුම් රු.48,489,811 කින්, එනම් සියයට 76 කින් අඩුවී තිබීම සහ අනෙකුත් ආදායම රු.34,986,914 කින් එනම් සියයට 38 කින් අඩුවී තිබීම ඉහත පරිදි ශුද්ධ ලාභය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවල ඌනතාවයක් පැවතියද නැවත 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂිකව අතිරික්තයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැළපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.338,370,664 ක සෘණ අගයක් වූ සංස්ථාවේ දායකත්වය 2014 වර්ෂයේ සිට ධන අගයක් බවට පත් වුවද, වාර්ෂිකව අඩුවී සමාලෝචිත වර්ෂය වන විට රු.37,026,792 ක ධන අගයක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 වගන්තිය සහ 5 (2) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විය යුතු මානව සම්පත් සංවර්ධන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම යන සැලසුම් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව සංයුක්ත සැලැස්මේ දක්වා ඇති ඉලක්ක යථාර්තවාදී සහ අත්පත් කරගත හැකි විය යුතු වුවත්, ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර සේවකයින් ඉවත් කළ ආයතනයකට ප්‍රායෝගිකව ඉටු කළ නොහැකි අරමුණු හා ඉලක්කයන් සංස්ථාවේ සැලැස්මේ දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) උක්ත චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය අනුව සංයුක්ත සැලැස්මේ ඇතුළත් විය යුතු වූ ආයතනයේ සංවිධාන ව්‍යුහය, මානව සම්පත්, කළමනාකරණ දක්ෂතා සහ තාක්ෂණික දැනුම, ආයතනය සතු වර්තමානයේ පවතින සම්පත් සහ පසුගිය වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය යන ප්‍රධාන කරුණු සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිමෙන්ති නිෂ්පාදනය කර අලෙවි කිරීම සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන සංස්ථාවේ ප්‍රධාන අරමුණු වුවත්, පසුගිය යුධමය වාතාවරණයෙන් පසුව කන්කසන්තුරේ සිමෙන්ති නිෂ්පාදනය නතර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට සිමෙන්ති බෑග් ආනයනය කර අලෙවි කිරීම සහ කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීමද සම්පූර්ණයෙන් නතර කර තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 ඔක්තෝබර් 20 දිනැති අංක පීඊ/ආර්ඊඑස්/වීආර්එස් දරන ලිපිය අනුව ස්වේච්ඡා විශ්‍රාම වන්දි ලබාදීමෙන් පසුව සංස්ථාව විසින් ඉතිරි සේවකයින් යොදවා බදු කුළිය නිර්ණය, කන්කසන්තුරේ ඇතුළු ඉතිරි ඉඩම් සඳහා බදු කුළීකරුවන් සොයා ගැනීම, බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම ආදී කටයුතු සිදුකර එම ආදායමින් සේවක ගෙවීම් ගෙවා ඉතිරිය රජයට ප්‍රේෂණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව ඒ අනුව ක්‍රියා කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයට සාපෙක්ෂව 2015 වර්ෂයේදී සංස්ථාව විසින් අලෙවිය සඳහා සිමෙන්ති මිලදී ගැනීම සියයට 91 කින් පහළ බැස තිබූ අතර, එම අඩුවීම 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 90 ක් විය. 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අලෙවිය සියයට 77 කින් එනම්, රු.46,146,262 කින් අඩුවී තිබුණි. 2017 මුල් අර්ධ වර්ෂයෙන් පසු සිමෙන්ති ආනයනය කර අලෙවි කිරීම නතර කර දැමීම මෙයට හේතුවී තිබුණි.

(ඈ) කන්කසන්තුරේ කොන්ක්‍රීට් නිෂ්පාදන සහ අලෙවි අංශයේ මුළු අලෙවි ආදායමට වඩා වියදම් දැරීමට සිදුවීම නිසා දිගින් දිගට අලාභ ලබා තිබූ අතර, පසුගිය වසර පහ තුළදී කොන්ක්‍රීට් නිෂ්පාදන අලෙවිය 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය අතර රු.25,620,000 ක සිට රු.1,128,281 ක් අතර පරාසයක උච්ඡාවචනය වෙමින් පැවතුණි. 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කොන්ක්‍රීට් කණු අලෙවිය සියයට 72 කින් පහළ බැස තිබූ අතර, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම නතර කර දැමීම ඒ සඳහා හේතුවී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ බැංකු ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොත අනුව බැංකු ශේෂය රු.608,359 ක් වුවත්, ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශන අනුව එම බැංකු ජංගම ගිණුමේ ශේෂය රු.2,156,449 ක් වීම නිසා රු.1,548,090 ක වෙනසක් නිරීක්ෂණය විය. 2008 වර්ෂයට පෙර සිට පැවත එන මෙම වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ කළමනාකරණය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය බැංකු මඟින් ලබාගත් ගෙවිය යුතු මුළු බැංකු ණය වටිනාකම රු.97,793,352 ක් විය. එම බැංකු ණය සඳහා සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද මුළු බැංකු ණය පොළිය රු.19,880,338 ක් වූ අතර, සංස්ථාවේ අකාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය නිසා විශාල මූල්‍ය පිරිවැයක් වාර්ෂිකව රාජ්‍ය බැංකු සඳහා ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසුව සංස්ථාව සතු ලංකා සිමෙන්ති සමාගමේ සියයට 62.45 ක කොටස්, කොටස් වෙළඳපළේ විකුණා රජයට ආදායමක් ලබාදීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 ඔක්තෝබර් 20 දිනැති අංක පීඊ/ආර්ඊඑස්/වීආර්එස් දරන ලිපිය අනුව උපදෙස් ලබාදී තිබුණද 2018 ජූලි දක්වාම කළමනාකරණය විසින් ඊට අදාළ පියවර ගෙන නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව සහ ගොඩනැගිලි සංකීර්ණය පිහිටි අක්කර 741 ක් වූ ඉඩමෙන් අක්කර 297 ක් ගැසට් නිවේදනයක් මඟින් සංස්ථාව වෙත පවරා තිබුණද ඉතිරි අක්කර 444 ක ඉඩම්වල හිමිකාරීත්වය පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී. මෙම ඉඩම, කර්මාන්තශාලාව සහ ගොඩනැගිලි අධි ආරක්ෂිත කලාපයේ යුධ හමුදාව භාරයේ නිෂ්ක්‍රීය වත්කම් ලෙස පැවතුණි.

(ආ) 1967 ජූලි 12 දිනැති අංක 14756/7 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ අංක 288 දරන ඔප්පුව මඟින් කොල්ලුපිටියේ පිහිටි පර්චස් 89.9 ක ඉඩම සංස්ථාවට හිමිවී තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට තක්සේරු වටිනාකම රු.735,000,000 ක් වූ මෙම ඉඩම, 2008 වර්ෂයේ සිට රාජ්‍ය බැංකුවකට උකස් කර ණය ලබාගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ණය ශේෂය රු.97,793,352 ක් විය. ගාළු පාරට යාබදව පිහිටි මෙම ඉඩම, වසර 50 ක කාලයක් තුල ඵලදායී කාර්යයකට යොදා නොගෙන නිෂ්ක්‍රීය වත්කමක් ලෙස පැවතුණි.

(ඇ) පුත්තලම දිස්ත්‍රික්කයේ පාලවි හි පිහිටි අට්ටවිල්ලු නැමති සංස්ථාව සතුව පවතින අක්කර 221 ක් වූ ඉඩමෙන් අක්කර 159 ක් වසර 40 ක සිට ඵලදායී කාර්යයකට යොදාගෙන නොතිබුණි.

## 4.4 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1981 වර්ෂයේදී ආරම්භ කරන ලද සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින් සියයට 62.45 ක හිමිකාරීත්වයක් සංස්ථාව සතු වුවද, එම ආයෝජනය සඳහා පසුගිය වසර 26 ක කාලය තුළ කිසිඳු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලබා දී නොතිබුණි.

(ආ) අලෙවි කිරීම සඳහා ආනයනය කරන ලද එකතු වටිනාකම රු.798,917 ක් වන කිලෝග්‍රෑම් 50 සිමෙන්ති බෑග් 1,128 ක් කල් ඉකුත් වීම නිසා රු.350,000 කට අලෙවි කිරීම හේතුවෙන් සංස්ථාවට රු.448,937 ක අලාභයක් සිදුවී තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ කාර්ය මණ්ඩලය 2016 ජූලි 31 දින සිට ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් මඟින් විශ්‍රාම ගොස් තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට තත්‍ය කාර්ය මණ්ඩලය 14 දෙනෙකුට සීමා වී තිබුණි. ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසුව සංස්ථාවේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සිමෙන්ති සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සිමෙන්ති සංස්ථාව විසින් නිසියාකාරව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සිමෙන්ති සංස්ථාවේ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

2016 ජූලි මාසයේදී ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර සංස්ථාවේ සේවකයන් විශ්‍රාම යැවීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ අභ්‍යන්තර විගණනය සඳහා කිසිම නිලධාරියෙකු සේවයේ යොදවා නොතිබූ අතර, වර්ෂය තුළ සංස්ථාවේ අභ්‍යන්තර විගණනයට අදාළ කිසිඳු කාර්යයක් ඉටු කර නොතිබුණි.

### 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.3.1 ප්‍රසම්පාදනයන්

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව, තාක්ෂණික අධ්‍යයනයක් සිදු කිරීම සඳහා සංස්ථාවට අයත් අරුවක්කාලු ඉඩම, පෞද්ගලික සමාගමකට ලබාදී තිබුණි. මෙම තාක්ෂණික අධ්‍යයනය පිළිබඳව සංස්ථාව සහ පෞද්ගලික සමාගම අතර, ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි.

**6.4 අයවැය පාලනය**

---

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 09 ක අයවැයගත හා තත්‍ය වියදම් වල සියයට 23 සිට සියයට 229 දක්වා විචලනයන් පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6.5 නොවිසඳී ඇති විගණන ඡේද**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය පදනම මත සිමෙන්ති විකිණීම සඳහා අළෙවි නියෝජිත ධූරය ප්‍රදානය කිරීමේදී ණය පදනම මත ලබාදෙන වටිනාකමට සරිලන ඇප බැඳුම්කරයක් ලබා නොගැනීම, ණය ලබාදීමේදී සහ ණය එකතු කිරීමේදී කළමනාකරණය විසින් විධිමත් හා කාර්යාක්ෂම ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකතුව රු.52,506,824 ක් වූ ණය ශේෂය අය කරගෙන නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් රු.1,200,000 කට මිලදී ගන්නා ලද ගාල්ල, උණවටුන, කැස්බෑපාන පිහිටි අක්කර 06 ක් වූ ඉඩම කළමනාකරණය විසින් ඵලදායී කාර්යයක යොදා නොගැනීම නිසා ගාල්ල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සුනාමියෙන් විපතට පත්වූවන් නැවත පදිංචි කර තිබුණි. සංස්ථාව විසින් එම ඉඩම සඳහා වන්දි මුදල් ලබා ගැනීමට ගාල්ල දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

(ඇ) සංස්ථාවට අයත් පුත්තලම පිහිටි අක්කර 5352 ක අරුවක්කාලු හුණුගල් නිධිය වසර 50 ක කාල සීමාවක් සඳහා හොල්සිම් ලංකා සමාගමට බදු මුදල නොවෙනස්වන බදු ගිවිසුමක් යටතේ ලබා දී තිබුණි. 2011 අගෝස්තු 16 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදීද මෙම බදු ගිවිසුම සංශෝධනය කිරීමට උපදෙස් ලබාදී වසර 06 කට වැඩි කාලයක් ගත වුවත් එම බදු ගිවිසුම සංශෝධනය කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණය ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව 2010 වර්ෂයේ සිට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ පරිහරණය සඳහා ලබාදී තිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම සහ සමීක්ෂණ මණ්ඩල පත්කර වත්කම් සමීක්ෂණය ප්‍රමාද කිරීම. |
| (ආ) ගබඩා පාලනය | සිමෙන්ති තොග නඩත්තු කිරීම, ගබඩා කිරීම සහ තොග වාර්තා පවත්වා ගැනීම සම්බන්ධයෙන් නිසි අවධානය යොමු නොකිරීම. |

| | |
|---|---|
| (ඇ) අභ්‍යන්තර පාලනය | අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදී ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කර පාලනයක් පවත්වා නොගැනීම, අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර පවත්වා නොගැනීම. |
| (ඈ) ණයගැති හා ණයහිමි පාලනය | අයවිය යුතු ණය ශේෂ අයකර නොගැනීම, ණය අලෙවියට අදාළ වාර්තා නිසි පරිදි නඩත්තු නොකිරීම සහ ණයහිමියන් ගෙවා නිරවුල් නොකිරීම. |
| (ඉ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන අංශයක් මගින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබීම. |